# PRIME ENTRY BOOKS (Part-IV)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# බැංකු ගිණුම

මුදල් ගිණුම ව්‍යාපාරයේ දෘෂ්ටි කෝණයෙන් වත්කම් ගිණුමක් වන අතර, ව්‍යාපාරය වෙනුවෙන් බැංකුවේ පවත්වා ගනු ලබන ජංගම ගිණුම බැංකුවේ දෘෂ්ටි කෝණයෙන් වගකීම් ගිණුමක් වේ.

ඒ අනුව මුදල් ලැබීම් ජර්නලයට ඇතුළත් කරන, බැංකුව සමග සිදු කරන ගනුදෙනු බැංකුව විසින් ජංගම ගිණුමට බැර කරනු ලබයි.

**උදා :**
බැංකුවේ මුදල් තැන්පත් කිරීම.
බැංකුවේ චෙක්පත් තැන්පත් කිරීම්වලින් නිශ්කාෂණය (උපලබ්ධි) වූ චෙක්පත්වල වටිනාකම

ව්‍යාපාරය මුදල් ගෙවීම් ජර්නලයේ ඇතුළත් කරන බැංකුව සමග සිදු කරන ගනුදෙනු, බැංකුව විසින් ජංගම ගිණුමට හර කරයි.

**උදා :**
ව්‍යාපාරය නිකුත් කළ චෙක්පත්වල වටිනාකම්වලින් බැංකුවෙන් ගෙවීම් කර ඇති චෙක්පත්වල වටිනාකම.

ClassWork.LK

ව්‍යාපාරයේ මුදල් ගිණුමේ (ලැබීම් ජර්නලයේ හා ගෙවීම් ජර්නලයේ) සටහන් නොවූ පහත සඳහන් අයිතමයන් ද, බැංකු ප්‍රකාශනයේ ඇතුළත් ව තිබිය හැකි ය.

| ගෙවීම් ජර්නලයේ ඇතුළත් නොවූ | ලැබීම් ජර්නලයේ ඇතුළත් නොවූ |
|---|---|
| • ස්ථාවර නියෝග මත සිදු කළ ගෙවීම්.<br>• බැංකුව අය කළ බැංකු ගාස්තු<br>• චෙක්පොත් ගාස්තු<br>• අය කළ පොළී ආදිය | • බැංකුවට සෘජුව ම ලැබී ඇති<br>• වට්ටනාකම් (සෘජු ප්‍රේෂණ)<br>• ණයගැති ලැබීම්<br>• ආයෝජන ආදායම්<br>• ලාභාංශ ආදායම්<br>• පොලී ආදයම් |

**<u>ඉහත කරුණුවලට අමතර ව මුදල් ගිණුමේත් බැංකු ප්‍රකාශනයේත් ශේෂයන්ගේ අසමානතාවට බලපෑ හැකි කරුණු</u>**

- ➢ ව්‍යාපාරය ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදු විය හැකි වැරදි හා අඩුපාඩු
- ➢ බැංකුවෙන් සිදු විය හැකි වැරදි සහ අඩුපාඩු

ClassWork.LK

# මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය

මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමේ දී පහත සඳහන් හේතු පමණක් අදාළ කර ගනියි.

| මුදල් ගිණුමට හර කරන අයිතම | මුදල් ගිණුමට බැර කරන අයිතම |
| --- | --- |
| බැංකුවට සෘජුව ම ලැබී ඇති ප්‍රේෂණ<br><br>ව්‍යාපාරයේ ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදු වී ඇති වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීමට කළ යුතු හර කිරීම් | බැංකුව විසින් ජංගම ගිණුමෙන් අඩු කර ගෙන ඇති ස්ථාවර නියෝග මත කළ ගෙවීම්<br><br>අය කළ ගාස්තු, චෙක්පත් ගාස්තු, අයිරා පොලී<br><br>ව්‍යාපාරයේ ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදුවූ වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීමට කළ යුතු බැර කිරීම් |

ClassWork.LK

## බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීම

මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමෙන් පසු, බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරනු ලබයි. එහි දී මුදල් ගිණුමේ සංශෝධිත ශේෂයට,

- එම කාලය තුළ බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම එකතු කළ යුතු ය.

- එම කාලය තුළ නිශ්කාෂණය නොවූ චෙක්පත්වල වටිනාකම් අඩු කළ යුතු ය.

- බැංකුව විසින් ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදු වී ඇති වැරදි සහ අඩුපාඩු සුදුසු පරිදි එකතු කිරීම හෝ අඩු කිරීම කළ යුතු ය.

ගැලපීම්වලින් පසු බැංකු ප්‍රකාශනයේ සඳහන් වටිනාකම ලැබේ.

ClassWork.LK

# මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම හා බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ ආකෘති

මුදල් පාලන ගිණුම/මුදල් ගිණුම (සංශෝධිත)

| රු | | රු | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | x x x | සටහන් නොවූ ස්ථාවර නියෝග | |
| සටහන් නොවූ සෘජු ප්‍රේෂණ | x x x | මත ගෙවීම් | x x x |
| අගරු වූ නිකුත් කල චෙක්පත් | x x x | බැංකු ගාස්තු | x x x |
| තැන්පත් කළ චෙක්පත්වල අගය | x x x | චෙක්පත් ගාස්තු | x x x |
| අඩුවීම | x x x | අගරු වූ තැන්පත් කළ චෙක්පත් | x |
| | | සටහන් නොවූ නිකුත් කල චෙක්පත් | x |
| | | ශේෂ/ප/ගෙ | x x |
| | x x x | | x x |
| ඉ/ගෙ/ශේ | x x | | |

ClassWork.LK

.................................................බැංකු සැසඳුම් ප්‍රකාශනය

| | | |
|---|---|---|
| මුදල් පාලන ගිණුමේ/මුදල් ගිණුමේ සංශෝධිත **ශේෂය** | | ××× |
| **එකතු කළා :** | | |
| ඉදිරිපත් නොවූ චෙක්පත් | ×× | |
| බැංකු ප්‍රකාශනයේ සිදු වී ඇති වැරදීම් | ×× | ×× |
| **අඩු කළා :** | | |
| නිෂ්කාශණය නොවූ චෙක්පත් | ×× | |
| බැංකු ප්‍රකාශනයේ සිදු වී ඇති වැරදීම් | ×× | (××) |
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | | ××× |

ClassWork.LK

# නිදසුන්

(01) ''අමල් ව්‍යාපාරය '' 2016 අප්‍රේල් මාසයට අදාළ ව මුදල් ලැබීම් ජර්නලය පහත දැක්වේ.

## මුදල් ලැබීම් ජර්නලය

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | දුන් වට්ටම් (රු.) | වටිනාකම (රු.) | විශ්ලේෂණය (රු.) | |
|---|---|---|---|---|---|---|
| | | | | | ණයගැති | විකුණුම් |
| 2016. 04. 05 | විකුණුම් | 147 585 | - | 16 000 | - | 16 000 |
| 2016. 04. 08 | චාමර | 218 570 | 500 | 10 000 | 10 000 | - |
| 2016. 04. 10 | විකුණුම් | - | - | 5 000 | - | 5 000 |
| 2016. 04. 15 | මේනක | 412870 | 800 | 12 000 | 12 000 | - |
| 2016. 04. 20 | සම්පත් | 241 711 | 300 | 8 000 | 8 000 | - |
| 2016. 04. 22 | රුවන් | 281 620 | 700 | 15 000 | 15 000 | - |
| 2016. 04. 25 | සාගර | -- | 1 000 | 19 000 | 19 000 | - |
| | | | 3 300 | 85 000 | 64 000 | 21 000 |

2016 අප්‍රේල් මාසයට අදාළ මුදල් ගෙවීම් ජර්නලය පහත දැක්වේ.

## මුදල් ගෙවීම් ජර්නලය

| දිනය | විස්තරය | චෙක් අංකය | ලැබූ වට්ටම් (රු.) | වටිනාකම (රු.) | විශ්ලේෂණය (රු.) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ණයහිමි | ගැනුම් | වියදම් | වෙනත් ගෙවීම් |
| 2016.04.04 | ගැනුම් | 211010 | - | 6 000 | - | 6 000 | - | - |
| 2016.04.06 | සේනක | 211011 | 500 | 15 000 | 15 000 | - | - | - |
| 2016.04.08 | විදුලිය | 211012 | - | 6 000 | - | - | 6 000 | - |
| 2016.04.12 | කෝකිලා | 211013 | 1 000 | 18 000 | 18 000 | - | - | - |
| 2016.04.18 | සුළු මුදල් | 211014 | - | 2 000 | - | - | - | 2 000 |
| 2016.04.25 | ගැනිලි | 211015 | - | 5 000 | - | - | - | 5 000 |
| 2016.04.28 | ගෙවල් කුලී | 211016 | - | 6 000 | - | - | 6 000 | - |
| 2016.04.29 | ගැණුම් | 211017 | - | 4 000 | - | 4 000 | - | - |
| | | | 1 500 | 62 000 | 33 000 | 10 000 | 12 000 | 7 000 |

ClassWork.LK

මුදල් පාලන ගිණුම/මුදල් ගිණුම

| | | රු. | | රු |
|---|---|---|---|---|
| 4/1 | ඉ/ගෙ/ශේෂය | 12 000 | ණයහිමි පාලන | 33 000 |
| | ණයගැති පාලන | 64 000 | ගැණුම් | 1 000 |
| | විකුණුම් | 21 000 | වියදම් | 12 000 |
| | | | වෙනත් ගෙවීම් | 7 000 |
| | | | 4/30 ශේෂය | 44 000 |
| | | 97 000 | | 97 000 |
| | ඉ/ගෙ/ශේ | 44 000 | | |

2016 අප්‍රේල් මාසය සඳහා බැංකුවෙන් ලද ගිණුම් ප්‍රකාශනය පහත දැක්වේ.

## 2016 අප්‍රේල් මාසයේ බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර රු. | බැර රු. | ශේෂය රු. |
|---|---|---|---|---|
| 4/01 | ශේෂය | - | 12 000 | 12 000 |
| 4/08 | චෙක් 147585 චෙක් | - | 16 000 | 28 000 |
| 4/10 | 211010 මුදල් | 6 000 | - | 22 000 |
| 4/10 | චෙක් 211011 චෙක් | - | 5 000 | 27 000 |
| 4/12 | 412870 චෙක් | 15 000 | - | 12 000 |
| 4/15 | 211013 චෙක් | - | 12 000 | 24 000 |
| 4/16 | 211014 චෙක් | 18 000 | - | 6 000 |
| 4/18 | 218570 චෙක් | 2 000 | - | 4 000 |
| 4/20 | 211015 මුදල් | - | 10 000 | 14 000 |
| 4/25 | චෙක් 211016 | 5 000 | - | 9 000 |
| 4/25 | චෙක් පොත් ගාස්තු | - | 19 000 | 28 000 |
| 4/30 | ලාභාංශ | 6 000 | - | 22 000 |
| | | 1 000 | - | 21 000 |

ClassWork.LK

ඉහත ඉදිරිපත් කර ඇති මුදල් පාලන ගිණුමේ හා බැංකු ප්‍රකාශනයේ අප්‍රේල් 30 වන දිනට ශේෂය අසමානවීමට හේතු දක්වා මුදල් පාලන ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම හා බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරන්න.

ClassWork.LK

**<u>විසඳුම :</u>**

<u>බැංකු ප්‍රකාශනයේ හා මුදල් පාලන ගිණුමේ ශේෂය අසමානවීමට බලපෑ කරුණු</u>

තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්

චෙක් අංක 241711 රු. 8 000

චෙක් අංකය 281620 රු. 15 000

බැංකුවට සෘජුව ම ලද ලාභාංශය රු. 4 000

නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්

චෙක් අංක 211012 රු. 6 000

චෙක් අංක 211017 රු. 4 000

බැංකුව අය කර ගත් චෙක්පොත් ගාස්තුව රු. 1 000

මුදල් ගෙවීම් ජර්නලයේ ගැනුම් තීරුවේ එකතුව රු. 10 000, මුදල් පාලන ගිණුමේ රු. 1 000 ලෙස සටහන් වීම.

ClassWork.LK

# මුදල් පාලන ගිණුම සංශෝධනය කිරීම

**මුදල් පාලන ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| ශේෂය | 44 000 | චෙක්පොත් ගාස්තුව | 1 000 |
| ලාභාංශ | 4 000 | ගැනුම් අඩු වීම | 9 000 |
| | | ශේ/ප/ගෙ | 38 000 |
| | 48 000 | | 48 000 |
| ශෙ/ප/ගෙ | 38 000 | | |

## බැංකු සැසඳුම පිළියෙල කිරීම

2016. 04. 30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය

| | | |
|---|---|---|
| මුදල් පාලන ගිණුමේ නිවැරදි ශේෂය 38 000 | | 38 000 |
| එකතු කළා : | | |
| නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක් | | |
| 211012 | 6000 | |
| 211017 | 4000 | 10000 |
| | | 48000 |
| අඩු කළා : | | |
| උපලබ්ධි නොවූ චෙක්පත් | | |
| 241711 | 8000 | |
| 281620 (23 000) | 15 000 | (23 000) |
| බැංකු ප්‍රකාශනයේ ශේෂය | | 25 000 |

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura